# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1859 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 17/12/2024 පැය 0600

# මාධ්‍ය නිවේදනය

**01. වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම - මහියංගනය පොලිස් වසම.**

2024.12.02 වන දින සවස් කාලයේ මහියංගනය පොලිස් වසමේ වදකහදෝව ප්‍රදේශයේ හේන් යායකදී එම පොලිස් වසමේ 56 කණුව ප්‍රදේශයේ පදිංචිව සිටි වයස අවුරුදු 44 ක පුද්ගලයෙකු සැකකටයුතු ලෙස වෙඩි වැදී මිය යාමේ සිද්ධියක් සම්බන්ධයෙන් මහියංගනය පොලිසිය විසින් විමර්ශන ආරම්භ කර තිබුණි.

මරණකරු තවත් පුද්ගලයින් තිදෙනෙකු සමඟ බිම්මල් කැඩීමට ගොස් සිටින අතරතුරදී ඔවුන් අතර සිටි පුද්ගලයෙකු සතුව තිබූ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් ක්‍රියාත්මක වීමෙන් මෙම මරණය සිදුව ඇති බවටත්, මෙම සිද්ධිය මනුෂ්‍ය ඝාතනයක් බවටත් දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඒ අනුව සිද්ධියට අදාල සැකකරුවන් තිදෙනා 2024.12.16 වන දින මහියංගනය පොලිස් ස්ථානයට ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 36, 44 හා 51 වයස් වල පසුවන 56 කණුව, ගොඩපෝරුවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මහියංගනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. දිය අනතුරකින් විදේශීය ජාතිකයින් සිව් දෙනෙකු බේරා ගැනීම - හික්කඩුව පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.**

2024.12.16 වන දින උදෑසන කාලයේ හික්කඩුව පොලිස් වසමේ හික්කඩුව මුහුදු තීරයේ දිය නාමින් සිටි රුසියානු ජාතික පිරිමි පුද්ගලයෙකු, කාන්තාවක් හා දැරියන් දෙදෙනෙකු දිය වැලකට හසුව ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් විසින් බේරා ගෙන ප්‍රථමාධාර ලබා දී පිටත් කර හැර ඇත.

**දිය අනතුරින් මුදාගත් පිරිමි පුද්ගලයා වයස අවුරුදු 40ක් හා කාන්තාව වයස අවුරුදු 39ක්ද, දැරිවියන් දෙදෙනා අවුරුදු 07 හා 13 යන වයස් වල පසුවන එකම පවුලේ සාමාජිකයන් වේ.**

හික්කඩුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කරනු ලබන පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් පරික්ෂක හේවගේ, පොලිස් කොස්තාපල් 96793 ඒකනායක, පොලිස් කොස්තාපල් 102748 දිසානායක හා පොලිස් කොස්තාපල් 105456 ජයසිංහ යන නිලධාරීන් විසින් මෙම දිවි බේරා ගැනීම සිදුකර ඇත.

## 03. හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - එඬේරමුල්ල පොලිස් ස්ථානය.

2024.12.16 වන දින උදෑසන කාලයේ එඬේරමුල්ල පොලිස් වසමේ එඬේරමුල්ල නගරයේදී එඬේරමුල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 100 ක්** සන්තකයේ තබා ගෙන යතුරු පැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරුගෙන් සිදු කරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමෙන් පසු සැකකරුගේ නිවසේ සඟවා තිබියදී **හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 840ක්** පොලිසිය විසින් සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන හුණුපිටිය, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

එඬේරමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාවනැල්ල පොලිස් ස්ථානය.

2024.12.16 වන දින දහවල් කාලයේ මාවනැල්ල පොලිස් වසමේ මයුරපාද හන්දිය ආසන්නයේදී මාවනැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 250 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන අනුරාධපුරය, උළුක්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2024.12.17 වන අද දින අළුයම් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ පට්ටිය හන්දිය අසලදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 600 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 24 ක් වන රත්නපුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මත්පෙති සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - වරකාපොල පොලිස් ස්ථානය.

2024.12.16 වන දින සවස් කාලයේ වරකාපොල පොලිස් වසමේ අඹේපුස්ස හන්දිය ආසන්නයේදී වරකාපොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මත්පෙති 180 ක්** සන්තකයේ තබා ගෙන සිටි අඹුසැමි යුවළක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් සහ සැකකාරිය අවුරුදු 21 ක් වන අඹේපුස්ස ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වරකාපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.12.16 වන දින දහවල් කාලයේ මුල්ලේරියාව පොලිස් වසමේ මහවෙල ප්‍රදේශයේදී නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1200 (බැරල් 08) ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මුල්ලේරියාව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 62 ක් වන අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුල්ලේරියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාමක් - කැබිතිගොල්ලෑව පොලිස් වසම.**

2024.12.16 වන දින සවස් කාලයේ කැබිතිගොල්ලෑව පොලිස් වසමේ හේරත්හල්මිල්ලෑව ප්‍රදේශයේදී විදුලි රැහැනක ගැටී විදුලි සැර වැදීමෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට කැබිතිගොල්ලෑව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සතුන් දඩයම් කිරීම සඳහා අනවසරෙන් අදින ලද විදුලි රැහැනක ගැටී මෙම පුද්ගලයා මියගොස් ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කැබිතිගොල්ලෑව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කැබිතිගොල්ලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මෙරට නිෂ්පාදිත ගිනි අවි 03ක් සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පුලියන්කුලම පොලිස් ස්ථානය.**

2024.12.16 වන දින පුලියන්කුලම පොලිස් වසමේ වෙඩිවෛත්‍යකල්ලු ප්‍රදේශයේදී පුලියන්කුලම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 03ක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 03ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 18,19 හා 24 යන වයස් වල පසුවන ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පුලියන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10. මාරක රිය අනතුරක් - වත්තල පොලිස් වසම.**

2024.12.16 වන දින සවස් කාලයේ වත්තල පොලිස් වසමේ විලියම් හේකිත්ත මාර්ගයේ ලංකා විදුලිබල මණ්ඩලය අසලදී මට්ටක්කුලිය දෙස සිට හේකිත්ත මාර්ගයේ මීගමුව කොළඹ මාර්ගය දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කරගත නොහැකිව පෙරළීගොස් අනතුරක් සිදුව ඇති අතර, අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු රාගම ශික්ෂණ රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත. පසුපස අසුනේ ගමන් කළ කාන්තාවක් සුළු තුවාල ලබා ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මාරක රිය අනතුරක් - මහනුවර පොලිස් වසම.**

2024.12.16 වන දින උදෑසන කාලයේ මහනුවර පොලිස් වසමේ විලියම් ගොපල්ලව මාවතේ 02 කණුව අසලදී ගැටඹේ දෙස සිට මහනුවර දෙසට ධාවනය වූ යතුරු පැදියක් එම දෙසටම ධාවනය වූ බස් රථයකට ඉස්සර කිරීමට යාමේදි යතුරුපැදිකරුට යතුරු පැදිය පාලනය කරගත නොහැකිව පෙරළීගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදියේ පසු පැදිකාරියගේ හිස බස් රථයේ ආරක්ෂක වැටෙහි ගැටී එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 17 ක් වන ගෙළිඔය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

යතුරුපැදිය පැදවූ දැරියගේ පියා අනතුරින් සුළුතුවාල ලබා ඇත. මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර බස්රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මාරක රිය අනතුරක් - වැලිකඩ පොලිස් වසම.**

2024.12.16 වන දින උදෑසන කාලයේ වැලිකඩ පොලිස් වසමේ කලපලුවාව මාර්ගයේ අග්ගොන හන්දිය අසලදී මුල්ලේරියාව දෙස සිට අග්ගොන හන්දිය දෙසට ධාවනය වූ ලොරි රථයක් අතුරු මාර්ගයකට හැරවීමට යාමේදී මාර්ගය හරහා ගමන් ගත් පදික කාන්තාවකගේ ගැටී පදික කාන්තාව මාර්ගයට ඇද වැටී ලොරි රථයට පිටුපසින් පැමිණි කාර් රථයකට යටවීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරියගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අනතුරින් පසු කාර් රථය පලාගොස් ඇත. වැලිකඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - කඳාන පොලිස් වසම.**

2024.12.16 වන දින සවස් කාලයේ කඳාන පොලිස් වසමේ ජාඇල ගනේමුල්ල මාර්ගයේ බටගම ප්‍රදේශයේදී වැලිගම්පිටිය දෙස සිට ගනේමුල්ල දෙසට ධාවනය වූ බස් රථයක සිටි මගියෙකු බස් රථයේ පිටුපස දොරෙන් ඇද වැටීමෙන් බරපතල තුවාල ලබා ජාඇල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. බස්රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**